www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# වෝල්වීදියේ අර්බුදය හා ඇමරිකානු ධනවාදයේ බංකොලොත්කම

## The Wall Street crisis and the failure of American capitalism

**බැරි ග්‍රේ විසිනි**
**2008 සැප්තැම්බර් 16**

පැනී මේ සහ ෆ්‍රෙඩී මැක් යන උකස් මූල්‍ය යෝධයන් රජය විසින් පවරා ගැනීමෙන් සතියකට පසු වෝල් වීදියේ විශාලතම ආයෝජන බැංකු වන ලේහිමන් බ්‍රදර්ස් හා මෙරිල් ලින්ච් බංකොලොත්වීම ඇමරිකානු ධනවාදයේ කම්පිත අර්බුදයේ නව අවධියක් සටහන් කලේ ය.

සමස්ත ඇමරිකානු බැංකු ක්‍රමය පිලිබඳව කඳු ගැසෙන සැකය හා සන්ත්‍රාසයේ සංඥාවන් ලෙස සඳුදා ජාත්‍යන්තර වෙලඳපොල තියුනු ලෙස ඇද වැටුනි. යුරෝපය පුරා කොටස් වෙලඳපොල 4% ක් තරම් ඉහල මට්ටමකින් ගිලී ගියේ ය.

ඩව්ජෝන් සාමාන්‍ය අගය ඒකක 504ක් නැතිනම් 4.42%ක වැටීමත් සමග වෝල් වීදියේ වැටීම ඊටත්වඩා තියුනු ය. වෝල් වීදියේ ප්‍රධාන බැංකු දෙකක ඇදවැටීමේ සම්පූර්න ඇඟවීම තවමත් හරියට පැහැදිලි නුවූවත් විකුනා දැමීම් වේගවත් වන බවට සියලු ම ඇඟවීම් දක්නට ඇත.

මේ තත්වතුල ක්ෂනික කනස්සල්ල යොමුව ඇත්තේ ලෝකයේ විශාලතම රක්ෂන සමාගම වන ඇමරිකන් ඉන්ටර් නැෂනල් ගෲප් (ඒඅයිජී) හා එක්සත් ජනපදයේ විශාලතම ඉතිරිකිරීම් හා නය දෙන බැංකුව වන වොෂිංටන් මියුචුවල් යන බැංකුවල අනාගත ඉරනම කෙරෙහි ය. මේ දෙක ම බංකොලොත්කම මත ගාටයි.

දශක ගනනාවක සමපේක්ෂනයන් නිසා ගොඩ ගැසුනු නෝට්ටු වටිනාකම් ඇද වැටෙනවා මෙන් ලේහිමන් බ්‍රදර්ස් හා මෙරිල් ලින්ච්වල හදිසි අවසානය ආර්ථිකයෙන් විශාල මුදල් ප්‍රවාහයක් (ද්‍රවශීලතාවයක්) බැහැර කර ඇත. මේ ව්‍යාපාර ක්‍රියාකාරිත්වය මූල්‍ය කරනය සඳහා අත්‍යවශ්‍යවන්නා වූ ප්‍රග්ධනයයි. මෙලෙස ප්‍රග්ධනය ඉවත්වීම රැකියා හා අවපාතය තියුනු කරමින් ද නිවාස මිල ගනන්වලට හා පාරිභෝගික වියදම්වලට වල කපමින් සහ මේ වන විටත් මූල්‍ය වශයෙන් සෙලවී ඇති බැංකුවල ශේෂ පත්‍ර තව දුරටත් දුර්වල කරමින් නොවැලැක්විය හැකි ලෙස ආර්ථික කටයුතු පහතට ඇද දමනු ඇත.

එක්සත් ජනපදය හා ලෝක ආර්ථිකය තුල දිගහැරෙන ප්‍රචන්ඩ හා සැලකිය යුතු වෙනස්කම්, 1930 මහා අවපාතයෙන් පසු මෙතෙක් නොදුටු අති විශාල විපත්තියක පෙර නිමිති ය.

වසර 158ක් වයසැති ලේහිමන් බ්‍රදර්ස් හා 94 වසරක් වයසැති මෙරිල් ලින්ච් වැනි ඇමරිකානු ධනවාදයේ සුරුවම් බිඳවැටීම එක්සත් ජනපද පාලක කල්ලියේ මෙන් ම එහි දේශපාලන මෙන් ම ආර්ථික පද්ධතියේ "නිදහස් වෙලඳපොල" සංකල්පය තව දුරටත් අපවාදය කරා මෙහෙයවනු ඇත. දශක ගනනාවක නොසැලකිලිමත් සමපේක්ෂන මත ගොඩ නැඟුන නය කන්දරාවක ගිලෙන ධනවාදයේ යෝධයන්ගේ විලාසය මෙම බිඳවැටීමට වග කියයුතු එක් සමාජ පන්තියක් - ඇමරිකානු ධනපති පන්තිය - නොවැලැක් විය හැකි ලෙස අවමානයට ලක් කෙරෙනු ඇත.

කඳු ගැසෙන මූල්‍ය අර්බුදය ගැන පසුගිය වසරේ රජයේ ප්‍රකාශකයින්, මාධ්‍ය, වෝල් වීදිය හා දේශපාලන පක්ෂ දොඩා තිබූ සිත සනසන කතා සියලු විශ්වාසයන් අහිමි කර ගෙන ඇත. රජයේ මෑත ම ඇපවීම් තත්වය ස්ථාවර කරනු ඇත, එක්සත් ජනපදයේ බැංකු කටයුතු "මූලික වශයෙන් නිරෝගීය", නිවාස හා නය වෙලඳපොල "මුල්ලෙන් එලියට" ඒමට සූදානම් ය යන සහතික කිරීම කිසිවෙකු සනසන්නේ නැත.

සඳුදා ජනාධිපති බුෂ් කෙටි ධවල මන්දිර පෙනී සිටීමක දී එවැනි වාගාලාපයන් දෙඩවීය. ධවල මන්දිර ප්‍රවෘත්ති සාකච්ඡාවක දී භාන්ඩාගාර ලේකම් හෙන්රි පෝල්සන්, මූල්‍ය විනාසයට කවුරු වග කිව යුතු දැයි නගන ලද ප්‍රශ්නවලට පිලිතුරු දීම මගහැරි අතර ඒ වෙනුවට ඔහු "අනාගතය දෙසට යොමුව" සිටින බව ප්‍රකාශ කලේ ය.

ජනාධිපති අපේක්ෂකයින්වන රිපබ්ලිකන් පක්ෂයේ ජෝන් මැකේන් හා ඩිමොක්‍රටික් පක්ෂයේ බරක් ඔබාමා නොසැලකිලිමත් ප්‍රකාශ දෙඩූ අතර, ඒවා අපූරු වන්නේ ලුහුඬුබව හා ශූන්‍යත්වය නිසා ම පමනි ඒවායේ පාලක කල්ලි කවයන් පවා පලල්ව පිලිගෙන ඇත්තේ මහා අවපාතයෙන් මෙපිට දරුනු ම මූල්‍ය

අර්බුදය ජනාධිපතිවරනය මධ්‍යයේ දිග හැරෙමින පවතින බවයි. එහෙත් රිපබ්ලිකන් හෝ ඩිමොක්‍රැටික් අපේක්ෂකයන් එය සඳහන් කිරීමට තරම් වටිනා ලෙස සැලකුවේ නැත.

පක්ෂ දෙක හා ඒවායේ අපේක්ෂකයෝ ලෝක ඓතිහාසික මට්ටමක මූල්‍ය මගඩිය වටා ඇඟිලි තුඩුවලින් ඇවිදිති. මන්ද ඔවුන් එක සමානව ම පැටලී සිටින බැවිනි. ඔවුන් දෙදෙනාම ගැලවී ගත නොහැකි ලෙස වෝල් වීදියට බැඳී සිටින අතර එක හිතින් ම ඇමරිකානු ධනවාදය ආරක්ෂා කිරීමට කැප වී සිටිති.

වොෂින්ටනයේ හා වෝල් වීදියේ " ප්‍රතිසංස්කරන" ඉල්ලමින් ද, වෝල් වීදියට "වගකීම් භාරය" ගෙන එන බවට සපත කරමින් ද මැකේන් ප්‍රකාශ නිකුත් කර ඇත. මෙය, වෝල් වීදියේ දේශපාලන උද්ඝෝෂකයන් සමූහයක් ද මහා ව්‍යාපාරිකයන් කොටසක් ද විසින් තම මැතිවරන ව්‍යාපාරය මෙහෙයවනු ලබන කෝටිපතියකුගේ ප්‍රකාශයකි.

ඔහුගේ ඩිමොක්‍රැටික් පාක්ෂික ප්‍රතිවාදියා වන බරක් ඔබාමා, "වොෂින්ටනයේ හා වෝල් වීදියේ බොහෝ දෙනා වගකීම ඉටු කර නැතැයි පැමිනිලි කරමින් පෙර දැකිය හැකි පරිදි ම වක්‍ර ප්‍රකාශයක් නිකුත් කලේ ය. ප්‍රජාතන්ත්‍රවාදී ජනාධිපතිවරුන්වන ජිමී කාටර් හා බිල් ක්ලින්ටන්ගේ "නිදහස් වෙලඳපොල" ප්‍රති-නියාම ප්‍රතිපත්ති නොතකා හරිමින් අර්බුදයේ වගකීම මුලුමනින්ම බුෂ්පරිපාලනය මත පැවරීමට උත්සාහ කරමින්, "මෙම ගැටලුවලට මම නිශ්චිතව ම සෙනේට් සහික මැකේන් මත වරද නොපටවන්නෙමි"යි ඔහුට හා මැකේන්ට අන්‍යොන්‍ය සමාව පුද කලේ ය.

මෙම සිදුවීම්, ඇමරිකානු හා ලෝක ධනවාදයේ ඓතිහාසික නොහැකියාව පිලිබඳ ඇඟවීම් ය. විරැකියාවේ, දිලිඳුකමේ, නිවාස නැතිකමේ හා කාලකන්නිකමේ වේගවත් වර්ධනයක් ලෙස කම්කරු පන්තිය මත මෙම විනාශය කඩා පාත්වනු ඇත. රජය, වෝල්වීදිය හා දේශපාලන පක්ෂ දෙක ඔවුන්ගේ ම ගිජුකමෙහි හා අකාර්යක්ෂමභාවයේ ඵලයන් මුලුමනින් ම ජනතාව මත පැටවීමට මාන බලති.

වෝල් වීදියේ සේවය කල, සමපේක්ෂන උත්පාතයේ ඇතැම් මූල්‍ය ප්‍රතිලාභ භුක්ති විඳි අය ඇතුලු ඉතිහාසයේ කවදාවත් නොවූ ස්තරයන්ට මෙම කඩා වැටීම විනාසකාරී ය. වෙනත් තැනක සමාන රැකියාවක් සොයා ගැනීමේ පුංචි බලාපොරොත්තුවක් සහිතව 26,000ක ලේහිමාන් සේවක සංඛ්‍යාවක් රැකියාවලින් දොට්ට වැටුනා පමනක් නොව සමාගමේ කොටස්වලින් 25%ක හිමිකරුවන් ලෙස ඔවුනට හිමි ඉතිරි කිරීම් හා විශ්‍රාමික අරමුදල් අතුගා හරිමින් ඩොලර් බිලියන 10ක ඒකාබද්ධ මුදලක් ඔවුනට අහිමි විය.

මෙරිල් ලින්ච් හා බෑන්ක් ඔෆ් ඇමරිකා යන ආයතන දෙක ඒකාබද්ධ කිරීමේ දී දස දහස් ගනනකගේ රැකියා අහිමි වන අතර, ඔවුහු පසුගිය වසරෙහි දී එක්සත් ජනපද මූල්‍ය සේවා ව්‍යාපාරයන්හි රැකියා කප්පාදුවට ලක් වූ 110,000 ට එකතු වනු ඇත.

තම රැකියා 25,000ක් කපන බවට හෙව්ලට් පැකාඩ් සඳුදා ප්‍රකාශ කරත් ම කඳු ගැසෙන මූල්‍ය අර්බුදයේ පලල් ගැටලු සම්බන්ධව අනතුරු හැඟවී ය.

අනෙක් අතට මෙම ආර්ථික අර්බුදය ඉක්මන් කරවූවෝ, ඔවුන් අතහැර දැමූ සුන්බුන්වලින් ද විපුලව ලාභ ලබනු ඇත. සංගතවල බිඳ වැටීම පිලිබඳ ඔට්ටු ඇල්ලූ ආරක්ෂක අරමුදල් (Hedg fund) හා අනෙකුත් කෙටි කාලීන විකුනුම් කරුවෝ මෝගන් ස්ටැන්ලි, ගෝල්ඩ්මන් සැච්ස්, එමෙන්ම බෑන්ක් ඔෆ් ඇමරිකා වැනි විශාල වානිජ බැංකු ද අතුරුදහන් වන බවට බියකරු ලෙස සමපේක්ෂනය කරති.

පැනී මේ හා ෆ්‍රෙඩී මැක් රජය විසින් අත් පත් කර ගනු ඇති බවට ඔට්ටු අල්ලමින් හා ඒ සඳහා උද්ඝෝෂනය කරමින් ජාතියේ විශාලතම බැඳීම් අරමුදල (Bond Fund) වන පිම්කෝහි විලියම් ග්‍රොස් ඩොලර් බිලියන 1.7ක් පසුගිය සතියේ උපයා ගත්තේ ය.

ප්‍රධාන වානිජ හා ආයෝජන බැංකුවල ප්‍රධානීන් සහභාගි වූ, භාන්ඩාගාර ලේකම් පෝල්සන් හා පෙඩරල් සංචිතයේ නිලධාරින් විසින් මෙහෙය වූ සති අන්ත හදිසි සාකච්ඡා මෙරිල් ලින්ච් රැක ගැනීමටත්, ක්‍රමානුකූලව ලේහිමන් දිය කර හැරීම සැලසුම් කිරීමටත් කේන්ද්‍ර වී තිබුනි. පෝල්සන්ගේ හා පෙඩරල් සංචිතයේ බලපෑම යටතේ, එක්සත් ජනපදයේ විශාලතම පාරිභෝගික වානිජ බැංකුව වන මෙරිල් ලින්ච් තමන් විසින් ම විකුනා ගැනීමට එකඟ විය.

මේ අතර ප්‍රාග්ධනය වසයෙන් ඩොලර් බිලියන ගනනක් එකතු කර නොගත හොත් බංකොලොත් භාවයට ඇද වැටීමට මුහුන දෙන ඒඅයිජී හි ඉරනම පිලිබඳව උනුසුම් සාකච්ඡා පැවැත්විනි. සඳුදා (සැප්තැම්බර 22) එක්සත් ජනපද වෙලඳපොල විවෘත කල විට කඩා වැටීම කල් දමා ගැනීමට ඒඅයිජීය පෙඩරල් සංචිතයෙන් හදිසි නයක් ඉල්ලමින් සිටියේ ය.

ඒඅයිජීහි ඇද වැටීම එක්සත් ජනපද හා ජාත්‍යන්තර නය පද්ධතිය පහතට ඇද දැමීමට තර්ජනය කරයි. මන් ද, ඊනියා "නය පැහැරහැරීම් හුවමාරුව" අනියම් වෙලඳපොලෙහි ඩොලර් ට්‍රිලියන ගනනක කොටස් ප්‍රමානයක් එය සතු බැවිනි. ඒඅයිජී සමාගම එකී "නය පැහැරහැරීම් හුවමාරු" කොන්ත්‍රාත්තු ලෝකය පුරා බැංකුවලට, ආරක්ෂක අරමුදල්වලට හා මහා ව්‍යවසායකයින්ට විකුනුවේ ය. මේ යටතේ සමාගම් නය පැහැර හරින අවස්ථාවල (විශාල පරාසයක සමාගම්වලට එය "උකස් අනුග්‍රහ නය" (Mortgage-backed debt) ඇප දෙයි. ඒඅයිජීය බංකොලොත් වුව හොත්, නය වෙලඳපොල අස්ථාවර කරමින්, නය

පැහැරහැරීම් හා බංකොලොත් වීම් වලක ප්‍රතිචාරයක බිය උපදවමින් රක්ෂනය කරන ලද නය වල වටිනාකම පෙර නොවූ විරූ මට්ටමකට ඇද වැටෙනු ඇත.

පසුගිය දෙසතියෙහි සිදුවීම් ඇමරිකානු මූල්‍ය ප්‍රභූව මුලු රටම බංකොලොත් භාවයට ගිල්වන බව විදහා පායි. මෙම සිදුවීම් ඒවා විසින් ම දිග්ගැස්සුනු ක්‍රියාවලිය හා බැඳුනු සංසිද්ධීන් ය.

දශක තුනක කාලයක් සඳහා "නිදහස් වෙලඳපොල" ලෞකික ආගමක තත්වයට ඔසවන ලදී ධනේශ්වර වෙලඳපොල එහි දෙවියා ය, සමාජවාදය එහි යක්ෂයා ය. මෙම කාල පරිච්ඡේදය, රිපබ්ලිකන් හා ඩිමොක්‍රැටික් පාලනයන් යටතේ ඇමරිකානු කම්කරු පනිතියේ ලක්ෂ සංඛ්‍යාත රැකියා හා ජීවනතත්වයන්ගේ වියදමින් එක්සත් ජනපදයේ නිෂ්පාදන පදනම බුරුතු පිටින් කඩා ඉවත් කරනවා දැක ඇත.

වෙලඳපෙලේ නොවරදින සුලු බව ගැන ප්‍රකාශ මගින් පෞද්ගලික ලාබ ඉපයීම පිලිබඳ සියලු බාධා ඉවත් කරමින් මූල්‍ය සුලුතරයේ අත් තුලට කිසිදා නොවූ තරම් අශිෂ්ට ලෙස ධනය අත්පත් කර ගැනීමට උසි ගන්වමින් මහා ව්‍යාපාර පවත්වා ගෙන යාමේ නීති ලිහිල් කරන ලදී. සමාජ කොල්ලකෑමේ මහා ක්‍රියාදාමය ඇරඹී ඇත, මෙහි දී රටේ ධනය පහල සිට ඉහල ම මට්ටම වෙතට නැවත බෙදී ගොස් ඇත.

කර්මාන්ත විශාල සංඛ්‍යාවක් සුන්බුන් බවට පත් කිරීම ද සමාජ අසමානතාවයේ ඉමහත් වර්ධනය ද ඇමරිකානු ධනවාදයේ ඓතිහාසික බිඳවැටීමේ විහ්නයන් ය. මෙම දිරාපත් වීමේ හදවතෙහි පවතිනුයේ පාලක කල්ලියේ පෞද්ගලික ධනවත්වීමේ සංතතිය නිෂ්පාදනයේ භෞතික සංතතියෙන් වෙන් වීමයි.

එක්සත් ජනපදය ලෝක නායකයෙකුව සිටිනුයේ නිෂ්පාදන තාක්ෂනය හෝ කාර්මික ශක්තිය තුල නොව මූල්‍ය සමපේක්ෂනය හා පරපුටුභාවය තුල ය. *නිව්යෝර්ක් ටයිම්ස්හි* ආර්ථික තීරු ලිපි රචකයකු වන ප්ලොයිඩ් නොරිස් සිකුරාදා කිව් පරිදි, "මෑත වසරවල දී ලේහ්මන්" අනෙකුත් තරග කරුවන් සමග හැකි තරම් අඩු මුදලක් වැය කරමින් වත්කම් මිලදී ගැනීමට නයට ගත් කාලය මත ගමන් කලේය.

නමුත් එහි නියම ස්වභාවය, එනම් ඇමරිකානු ධනවාදයේ පරපුටුභාවය පෙර නොවූ මට්ටමේ දූෂනයන් හා අපරාධයන් පන ගන්වා ඇත. වෝල්වීදියේ ප්‍රධාන විධායක නිලධාරීහු (සීඊඕ) වන්දි වශයෙන් ඩොලර් මිලියන ගනන් හා බිලියන ගනන් ප්‍රසාද දීමනා තමන්ට ම ප්‍රදානය කරගෙන ඇත. එය පෞද්ගලික ගිජුකමේ ප්‍රතිලාභ සඳහා සමාජ සම්පත් මුලුමනින් ම යුක්ති සහගත නොවන හා සමාජමය වශයෙන් විනාශකාරී නාස්ති කිරීමකි.

උදාහරනයක් ලෙස, 2007 අවසානයේ දී ලේහ්මන් පාලක මන්ඩලය එහි ප්‍රධාන විධායක නිලධාරී රිචඩ් එස් පුල්ඩ්ට ඩොලර් මිලියන 40ක් වටිනා වන්දි පැකේජයක් ප්‍රදානය කලේ ය. රෙඩා ඇසෝසියෙට් අනුව, ඔහුගේ සේවය නැවැත්වුවහොත් ඔහුට ඩොලර් මිලියන 63.3ක් බලාපොරොත්තු විය හැක. ඉඩා හෝ සන්වැලි හි නිවස ඇතුලු ඔහුගේ අනෙකුත් දේපලවලට, අමතරව 2004 දී ප්ලොරීඩාහි ජුපිටර් දූපතෙහි මුහුද ඉදිරිපිට නිවසට ඩොලර් මිලියන 13.75ක් ගෙව්වේ ය.

ලේහ්මන් හි පූර්ව සභාපති ජෝ ග්‍රෙගරි වැඩට යාමට හෙලිකොප්ටරයක් යොදා ගැනීමට පුරුදුව සිටයේ ය. ඔහු මෑත දී නිව් යෝර්ක් හි බ්‍රිජ්හැම්ටන් මුහුද ඉදිරිපිට, හතරැස් අඩි 9500ක් වන නිවස ඩොලර් මිලියන 32.5ට වෙලඳපොලට ඉදිරිපත් කලේ ය.

බැංකු ඩොලර් මිලියන 500ක පාඩුවක් වාර්තා කර තිබිය දී පවා විශාල එක්සත් ජනපද බැංකු හතක් පසුගිය අවුරුදු තුන තුල ඒවායේ ප්‍රධාන විධායක නිලධාරීන්ට ගෙවා ඇති වන්දි මුදලෙහි එකතුව ඩොලර් මිලියන 95ක් බව *ෆිනෑන්ෂල් ටයිම්ස්* මෑතක දී වාර්තා කලේ ය.

ශතවර්ශයෙන් තුන්කාලකට අධික කාලයකදී ඉතිහාසයේ විශාලතම ආර්ථික විනාසයට කාට? කුමකට? දොස් පැවරිය යුතු දැයි යන නිශ්චිත ප්‍රශ්නය මොනම දේශපාලන කන්ඩායමක් හෝ මාධ්‍ය ස්තාපිතයන් අසන හෝ ඔවුන්ට ඇසිය හැකි හෝ නොවේ.

වර්තමාන අර්බුදයේ ආරම්භයේ සිට මේ දක්වා ඒ පිලිබඳ බැරෑරුම් කොන්ග්‍රස් මන්ඩල විමසීමක් කර නොමැත, රජය මට්මේ පරීක්ෂාවක් නොමැත, වගකිව යුතු කවරෙකු හෝ අල්ලාගැනීමට උත්සාහයක් නොමැත. එක්සත් ජනපද ඉතිහාසයේ විශාලතම සාමූහික වස්තුව රජයට පවරා ගැනීම ඇතුලු වෝල් වීදියේ යෝධ සමාගම් ගලවා ගැනීමේ අරමුනින් " නිදහස් වෙලඳපොලේ" ශුද්ධ වූ සීමාවන්ට රජයේ මැදිහත්වීම කිසිදු ප්‍රසිද්ධ විවාදයකින් හෝ එකදු දේශපාලන පක්ෂයකින් මොනම ආකාරයේ සැලකිය යුතු විරෝධයකින් හෝ තොරව ක්‍රියාත්මක කර ඇත. මෙම කොල්ලකාරී සමාගම් ක්‍රියාමාර්ගයන්ගේ ප්‍රතිඵලයන් ලෙස මිලියන ගනනක් ඇමරිකානුවෝ ඔවුන්ගේ නිවාස හා රැකියා අහිමි කර ගනිති.

ඇමරිකානු ආර්ථික හා දේශපාලන අර්බුදයෙන් නිශ්චිත නිගමනයන් උකහා ගත යුතු ය. ලාභ ක්‍රමයේ රාමුව තුල මෙයට විසඳුම් නොමැත. පාලක කල්ලියේ ලාභය හා පෞද්ගලික වසනාව වෙනුවට මහජනතාවගේ අවශ්‍යතාවයන් පෙරට තබන සමාජවාදී වැඩ පිලිවෙලක් අවශ්‍ය ය.

සමස්ත මූල්‍ය පද්ධතියම පෞද්ගලික පාලනයෙන් ඉවතට ගෙන තැන්පත්කරුවන්ගේ හා කොටස්කරුවන්ගේ අයිතීන් සුරැකීමේ ප්‍රතිපාදන සහිතව කම්කරු පන්තියේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය යටතේ මහජන සේවයක ආකාරයෙන් ජනසතු කල යුතු ය. එය මහජනතාවගේ සමාජ අවශ්‍යතාවයන්ට යටත් විය යුතු ය. දිලිඳුකම හා විරැකියාව තුරන් කිරීමේ අරමුනින් නිෂ්පාදන බලවේග දියුනු කිරීමට හා ව්‍යාප්ත කිරීමට ද, සමස්ත ජනතාවගේ ම ජීවන තත්වයන් හා සංස්කෘතික මට්ටම් විශාල වශයෙන් නැංවීමට ද කැප විය යුතු ය.

මහා ආර්ථික විපත්තියට වගකිව යුත්තන් කරුනු දැක්වීමට කැඳවිය යුතු ය. සමාජ සම්පත් කොල්ලකා ඇති අයට සුදුසු දඬුවම් නියම කෙරෙන අපරාධ පරීක්ෂන පැවැත්විය යුතු ය. වංචාවන් අපරාධකාරීත්වය හරහා පෞද්ගලික බැංකුවලට හැරවූ බිලියන ගනනාවක් ගැන ප්‍රසිද්ධ පරීක්ෂාවන් කල යුතු ය. එවැනි උපයා ගැනීම් අත් පත් කර ගත යුතු අතර මහජන ශුභ සිද්ධිය සඳහා යොදවාගත යුතුය.

මෙය ඉදිරියට ගෙන යා හැකි එක ම බලවේගය කම්කරු පන්තිය යි. ඩිමොක්‍රැටික් පක්ෂයෙන් හා ද්විපාක්ෂික ක්‍රමයෙන් පැහැදිලි බෙදීමක් එයට අවශ්‍ය ය, විප්ලවවාදී සමාජවාදී වැඩ පිලිවෙලක පදනම මත තමන්ගේ ම පක්ෂය තුල කම්කරු පන්තියේ අතිමහත් සමාජ ශක්තිය ඒකරාසී කල යුතු ය.

සමාජවාදී සමානතා පක්ෂය සටන් වදිනුයේ මෙම වැඩ පිලිවෙලට ය.

© www.wsws.org